TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tels : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1 , එලිබෑන්ක් පාර , කොළඹ 05.
2019.10.19.

මහින්ද දේශප්‍රිය මහතා ,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>රාජ්‍ය නිලධාරින් දේශපාලන ප්‍රවර්ධන කටයුතු වල නියැලීම</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයට ලැබී ඇති පැමිණිල්ලකට අනුව, නිවාස සංවර්ධන අධිකාරිය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුල කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබ සිටින ග්‍රාම ශක්ති නිලධාරීන් මැතිවරණ කොට්ඨාශ මට්ටමින් දේශපාන ප්‍රවර්ධන කටයුතු සිදු කරන බවටත්, මෙසේ සේවයේ යොදවා ඇති 86 දෙනෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති බවටත් වාර්තා වේ.

ඒ අනුව මෙම නිලධාරීන්, හාරිස්පත්තුව ආසනයට අයත් කොන්ඩදෙණිය ප්‍රදේශයේ නිවෙස් වලට ගොස් දත්ත එක්රැස් කිරීමක් සිදු කර ඇති අතර, එක් මැතිවරණ කොට්ඨාශයකින් පුද්ගලයින් පස් දෙනෙකුගෙන් යුතු පිරිසක් තෝරාගෙන ඔවුන් මගින් අදාළ ප්‍රදේශයේ ගැටළු හඳුනාගෙන, ඉදිරියේදී එම ප්‍රදේශවල සංවර්ධනයට අවශ්‍ය සියලු වැඩ කටයුතු ඔවුන් හරහා සම්බන්ධීකරණය වන බව පවසා, එක් විශේෂ ජනාධිපතිධූර අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමට උත්සහ ගන්නා බවටත්, එලෙස එක්රැස් කරගත් දත්ත සෑම සතියකටම වරක් අදාළ අපේකෂකයාගේ මැතිවරණ මෙහෙයුම් අංශයට යොමු කරන බවටත් වාර්තා වී ඇත.

2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 2(i) නියමය අනුව රාජ්‍ය නිලධාරින් දේශපාලන ප්‍රවර්ධන කටයුතු වල නියැලීම නීති විරෝධී බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා මධ්‍යම පළාත් සම්බන්ධීකාරක තමාලි රාජපක්ෂ මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 076 322 344 2 / 076 322 366 2 යන දූරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට ,
විශ්වාසී ,

Lakvijaya Bandara

....................................
ලක්විජය බණ්ඩාර,
ජාතික සම්බන්ධීකාරක. (PPPR)